# මහජන නිවේදනයයි

**අයදුම්පත් සඳහා ආරාධනා**

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

## දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (GCF Knuckles Project)

උපදේශන අවස්ථාව - ***"බෙදාගත් යටිතල පහසුකම් සහ සම්පත් තක්සේරු කිරීම, සැකසුම් සැලැස්ම සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වෘත්තීය සේවා"***

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් (NEDA) "නකල්ස් කඳු පන්තියේ යැපුම් ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" (දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය- GCF Knuckles Project) යටතේ සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් වෘත්තීය ආයතන, උපදේශන සමාගම්වලින් අයදුම්පත් කැඳවයි. නකල්ස් ව්‍යාපෘති ප්‍රදේශයේ දේශගුණයට ඔරොත්තු දෙන හරිත ව්‍යවසාය සංවර්ධනය සක්‍රිය කිරීම සඳහා පවතින භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම් තක්සේරු කිරීම, වැඩිදියුණු කළ සහ නව යටිතල පහසුකම් යෝජනා කිරීම සහ තිරසාර ක්‍රියාකාරිත්වය සඳහා පාලන යාන්ත්‍රණ සැලසුම් කිරීම මෙම උපදේශනයේ අරමුණයි.

**සම්පූර්ණ තොරතුරු දැනගැනීම සඳහා පිවිසෙන්න.**

- **https://neda.gov.lk/gcf-knuckles-project**

**අයදුම් කළ යුත්තේ කවුරුන්ද ?**

යටිතල පහසුකම් සංවර්ධනය, ව්‍යවසායක පෙර වැඩුම් (Enterprise Incubation), ඩිජිටල් වේදිකා යෙදවීම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් කළමනාකරණය (PPP management) සහ ග්‍රාමීය ව්‍යවසායකයින් වෙත සහාය වීම පිළිබඳ විශේෂඥතාවය පළ කර ඇති වෘත්තීය සංවිධාන හෝ සමාගම්

**රාජකාරී ස්ථානය**

කොළඹ වන අතර සේවා අවශ්‍යතාවය පරිදි දිවයින පුරා රාජකාරි කිරීමට සිදුවේ.

**අයදුම් කරන ආකාරය**

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම සවිස්තරාත්මක තාක්ෂණික සහ මූල්‍ය යෝජනා, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ (BR) පිටපතක්, යෝජිත කණ්ඩායම් සාමාජිකයින්ගේ ජීව දත්ත පත්‍රිකා සහ යෝජිත ක්‍රමවේදය/ ප්‍රවේශය සමඟ ඉදිරිපත් කරන ලෙස මෙයින් ආරාධනා කෙරේ. ඔබේ අයදුම්පත සමඟ යෝජනාව **අධ්‍යක්ෂ, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, අංක 561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ පහ** යන ලිපිනයට මුද්‍රා තැබූ කවරයක දෙදහස් විසි පහේ නොවැම්බර් විසි වන දින ප.ව. 3:00 ට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු ය. ඊට අමතරව යෝජනාවේ මෘදු පිටපතක් එම අවසාන දිනයට පෙර director@neda.gov.lk වෙත විද්‍යුත් තැපැලෙන් එවිය යුතු ය.